# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2192/72 – 2020 සැප්තැම්බර් 11 වැනි සිකුරාදා – 2020.09.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 590/ඒ, මාගම්මන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මාගම්මන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/HMG/2019/388 හා 2019.08.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් පහත නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – අඹගහලන්ද, ඇටඹගහලන්ද සහ මොරගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.0368**

උතුරට: සිමෙන්ති කාණුව සහ පී. ඒ. එස්. කුමාරතිලක හිමිකම් කියන අඹගහලන්ද, ඇටඹගහලන්ද සහ මොරගහලන්ද; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B සහ සිමෙන්ති කාණුව.

02. **කැබලි අක්ෂර ‘B’ – අඹගහලන්ද, ඇටඹගහලන්ද සහ මොරගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.0327**

උතුරට: සිමෙන්ති කාණුව, කැබලි අක්ෂර A සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: කැබලි අක්ෂර A සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.) සහ කොතලාවල මාවත; බටහිරට: කොතලාවල මාවත සහ සිමෙන්ති කාණුව.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/5/2019/CEB/110.
2020 ජූලි මස 15 වැනි දින.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

09 – 706